HUMAN RESOURCE MANAGEMENT (Part-VIII)

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura

දුක්ගැනවිලි

රැකියාව හෝ රැකියා පරිසරය සම්බන්ධයෙන් සේවකයකු හෝ සේවක කණ්ඩායමක ඇතිවන මානසික කලකිරීමක් / කලකිරීම් සේවක දුක්ගැනවිල්ලක් / දුක්ගැනවිලි ලෙස නිර්වචනය කළ හැක.

එය ප්‍රකාශිත හෝ අප්‍රකාශිත විය හැකියි. දුක්ගැනවිලි කාර්යඵලවලට සෘජුවම බලපායි. ආයතනයේ පරමාර්ථ ඉටු කර ගැනීමට ඒවා බාධාකාරී වේ.

සේවක දුක්ගැනවිලි කාර්මික ආරවුල්වල මුල් අදියරයි. එබැවින් මුල් අවස්ථාවේම සේවක දුක්ගැනවිල්ලක් විසඳීමට පියවර ගත යුතුය.

ClassWork.LK



සේවක දුක්ගැනවිලි ඇතිවීම සඳහා හේතුකාරක

1. රැකියාව ආශ්‍රිත හේතු

- රැකියා විස්තරයට සඳහන් නොවන රාජකාරි හා වගකීම් සේවාදායකයාට පැවරීම.

- සේවාදායකයාගේ දැනුමට හා කුසලතාවට නොගැළපෙන රැකියාවක නියුක්ත කරවීම

ClassWork.LK

2. සේවා තත්ත්වයන් ආශ්‍රිත හේතු

- රැකියා ස්ථානය හෝ කාලය වෙනස් කිරීම.

- වෘත්තීය සෞඛ්‍ය හෝ ආරක්ෂාවට අහිතකර තත්ත්වයන් රැකියා ස්ථානයේ පැවතීම

3. මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්තිල ක්‍රියාපටිපාටි හා උපාය මාර්ගවලට අදාළ හේතු

- සේවක වැටුප් හා වේතන සහ දිරි දීමනා

- තමාට හිමිවීමට තිබූ උසස්වීමක් වෙනත් සේවකයෙකුට ලබා දීම, සේවයෙන් පහත හෙළීම්, මාරු කිරීම්, සේවය නවතාලීම් හා සම්බන්ධ ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි.

- නියමිත පරිදි උසස්වීම් ලබා නොදීම.

ClassWork.LK

4. සංවිධාන නීතරීති උල්ලංඝනය කිරීම්වලට අදාළ හේතු

- විනය කඩ කිරීම් සඳහා අසාධාරණ හෝ දැඩි විනයානුකූල ක්‍රියා මාර්ග ගැනීම.

- සාමුහික ගිවිසුමේ කොන්දේසි කළමනාකරණ පාර්ශ්වය විසින් කඩ කිරීම.

5. නුසුදුසු පුද්ගල චර්යාවන් සම්බන්ධිත හේතු

- ළඟා කර ගත නොහැකි අපේක්ෂා හෝ අවශ්‍ය තරමට වඩා යමක් පිළිබඳ අභිලාශ සහිත වීම.

- ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කෙරෙහි ඇති වැරදි ආකල්ප.

- සේවක අධි අභිමානය.

ClassWork.LK

6. රැකියාව හෝ රැකියා පරිසරයට පරිබාහිර පරිසරය සම්බන්ධිත හේතු

- පවුල් ඒකකය හා සම්බන්ධ හේතු.

- වෙනත් තරගකාරී ආයතනයක් සම්බන්ධ හේතු.

සේවක දුක්ගැනවිලි නිරාකරණය කිරීම නිසා ආයතනයකට අත්කර ගත හැකි ප්‍රතිලාභ

- සේවක පිරිවැටුම අඩු වීම.
- සේවක ප්‍රවාසිතාව පාලනය වීම.
- වෘත්තීය සමිති ක්‍රියා මාර්ග අවම වීම.
- කාර්මික සම්බන්ධතා වර්ධනය වීම මගින් කාර්මික සාමය යහපත් වීම.

- ආයතනයේ කීර්තිනාමය වර්ධනය වීම.

ClassWork.LK

සේවක දුක්ගැනවිලි නොවිසඳීම නිසා ආයතනයකට අත්විඳීමට සිදුවන අනිසි ප්‍රතිඵල

- ශ්‍රම පිරිවැටුම වැඩි වීම.
- සේවකයන් නිවාඩු ගැනීම් ඉහළ යාම.
- සේවකයන් හා කළමනාකරුවන් අතර ඇතිවන ගැටුම් ඇති වීම නිසා කාර්මික සාමය බිඳ වැටීම.
- ශ්‍රම ඵලදායීතාව අඩු වීම.
- නිෂ්පාදනයේ ගුණාත්වය පහළ යාම.
- ඵලදායීතාව අඩු වීම.
- නිතර නිතර පුරප්පාඩු පිරවීමට සිදු වන බැවින් පිරිවැය වැඩි වීම.

ClassWork.Lk

සේවක දුක්ගැනවිලි හඳුනා ගැනීමේ ක්‍රම

- ඉවත්ව යාමේ සම්මුඛ සාකච්ඡා - (ExitInterview)
- යෝජනා පෙට්ටිය - (Suggestion Box)
- සේවක ආකල්ප සමීක්ෂණ - (Attitude Survey)

සේවක දුක්ගැනවිලි විසඳීමේ ක්‍රමවේදයන්/ශිල්පක්‍රම

- දුක්ගැනවිලි විසඳීමේ විධිමත් ක්‍රියාපටිපාටිය (Formal Grievance Settlement Procedure)
- ආසන්නතම ප්‍රධානියා (Immediate Supervisor) මඟින්
- විවෘත දොරටු ප්‍රතිපත්තිය (An Open - Door Policy)

ClassWork.LK

- ඒකාබද්ධ කමිටු ක්‍රමය (Joint Committee Method)

- උපදෙශ් නය (Counseling)

- දුක්ගන්නාරාළ කෙනෙකු පත් කිරීම / ඔම්බුඩ්ස්මන්වරයකු පත් කිරීම (Ombudsman)

- බේරුම්කරණය (Arbitration)

සේවක දුක්ගැනවිලි නිරාකරණය හෙවත් විසඳීම සඳහා අනුගමනය කළ යුතු පියවර

- දුක්ගැනවිල්ලට මැනවින් සවන් දීම.

- දුක්ගැනවිල්ලට හා එය ඉදිරිපත් කරන සේවකයාට අදාළ ව නිවැරදි තොරතුරු රැස් කිරීම.

- සේවකයාට සමග ඒ හා සම්බන්ධව සාකච්ඡා කිරීම.

ClassWork.LK

- සේවකයා පවසන කරුණුවලට හොඳින් ඇහුන්කන් දීම.

- සේවකයා පවසන කරුණු නිවැරදි නම් ඒවා පිළිගැනීම.

- සේවකයා තුළ විශ්වාසය ගොඩ නැංවීම.

ClassWork.LK

2021
2022
2023

උසස් පෙළ

ගිණුම්කරණය

ආර්ථික විද්‍යාව

ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

තනි හෝ කණ්ඩායම් පන්ති

(English & Sinhala Medium)

0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura